# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ තනතුරු පුරප්පාඩු

## (01) පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය - (රත්මලාන)

**බඳවා ගන්නා ක්‍රමය :** ලිඛිත විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

(I) (**අ.**) අ.පො.ස (සා.පෙ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06ක් සිංහල භාෂාව/දෙමළ භාෂාව/ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිතය ඇතුළු විෂයන් 05 ක් සම්මාන සාමාර්ථ සහිතව සමත්වී තිබීම.

(**ආ.**) අ.පො.ස (උ.පෙ) විභාගය එක් වරකදී සාමාන්‍ය සාමාර්ථ 03 ක් සහිතව සමත් වී තිබීම

හෝ

(**අ.**) අපොස (සා.පෙ) විභාගය තුන්වරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06ක් සිංහල භාෂාව/දෙමළ භාෂාව/ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යය සහිතව සමත්වී තිබීම සහ උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයේ වසර 05 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය.

***සටහන : ඉහත මූලික සුදුසුකම් වලට අමතරව පුස්තකාල කටයුතු සම්බන්ධ සුදුසුකම් ඇති හෝ සේවා පළපුරුද්දක් ඇති අය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.***

වැටුප් පරිමාණය : **(U-MN 1-(IIIA)**
රු. 21932 - 17 × 213 - 25,553/- (මාසික)
මූලික වැටුප රු. 21932

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ)

## (02) කළමනාකරණ සහකාර (ලිපිකරු සේවා) III ශ්‍රේණිය - (දක්ෂිණ මණ්ඩපය - සූරියවැව)

**බඳවා ගන්නා ක්‍රමය :** ලිඛිත විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

(I) (අ) අ.පො.ස (සා.පෙ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළල ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය හා ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් එක් වරකදී සමත්වී තිබීම.

සහ

(ආ) අ.පො.ස (උ.පෙ) විභාගය එක් වරකදී සාමාන්‍ය සාමාර්ථ 03 ක් සහිතව සමත් වී තිබීම

සහ

(ඇ) අවුරුදු 02 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

(II) (අ) අ.පො.ස (සා.පෙ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළල ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය හා ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් එක් වරකදී සමත්වී තිබීම.

සහ

(ආ) අ.පො.ස (උ.පෙ) විභාගය එක් වරකදී සාමාන්‍ය සාමාර්ථ 03 ක් සහිතව සමත් වී තිබීම.

සහ

(ඇ) රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක මාස 06 කට නොඅඩු පරිගණක යෙදවුම් සහ කාර්යාල කළමණාකරණය පිළිබද පුහුණුවක් ලබා තිබීම.

**වෙනත් සුදුසුකම්**

1. වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : **(U-MN 1-(IIIA)**
රු. 21932 - 17 × 213 - 25,553/- (මාසික)
මූලික වැටුප රු. 21932

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ)

**පොදු කොන්දේසි**

1 තෝරා ගැනීම් සිදු කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ඒ ඒ තනතුර වලට අදාලව අනුමත කරන ලද බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටීන්ට අනුකූලව ලිඛිත / ප්‍රායෝගික සහ / හෝ සම්මුඛ පරීක්ෂණ වල ප්‍රතිඵල මතය.

2 ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලය මගින් ඒ ඒ තනතුරු/ ශ්‍රේණි සඳහා අනුමත කරන ලද පුරප්පාඩු සංඛ්‍යාව ඇතුලත පමණක් තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

3 අයදුම් කරුවන් තමන් විසින් පිළියෙල කරන ලද අයදුම් පත් 2017 සැප්තැම්බර් මස 29 වන දින හෝ එයට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරී කාර්යාලය වෙත සුරක්ෂිතව භාර දිය යුතුය.

4 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත සහ සම්මුඛ පරීක්ෂණයන් සඳහා කැඳවනු ලැබේ.

5. ඉදිරිපත් කර ඇති අයදුම් පත් සම්බන්ධයෙන් බලපෑම් කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.